# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1812/9 – 2013 මැයි 28 වැනි අඟහරුවාදා – 2013.05.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: 3/2/3/10/233.

රංපොකුණුගම බෞද්ධ මධ්‍යස්ථානය පිහිටි ඉඩම පොදු අවශ්‍යතාවක් සඳහා අත්කර ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 349/ඒ, රංපොකුණුගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මඩුවේගෙදර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවට ගම්පහ කොට්ඨාස භාර මැනුම් අධිකාරි විසින් සකස් කරන ලද අංක ගම්. 3352 පිඹුරේ සඳහන් ඉඩම් කොටස:

**කැබලි අංක 1**

ඉඩමේ නම: පොකුණුවලේ වත්ත; විස්තරය: පන්සල් වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02; ප්‍රමාණය: හෙක්. 0.3484.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 ජූලි මස 24 වැනි දින පූ. භා. 10.00 ට අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 ජූලි මස 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කළ යුතුයි.

ඩී. එම්. රත්නායක,<br>ප්‍රාදේශීය ලේකම්,<br>අත්තනගල්ල.

2013 මැයි මස 14 වැනි දින,<br>අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 – 215

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: බීඕපී/4/1/1-38.<br>ඉඩම් අමාත්‍යාංශ යොමු අංක: එල්ඩී/05/2006/පීසී/285.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බෝපෙ - පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කලේගාන දකුණු ග්‍රාම නිලධාරී වසමෙහි කලේගාන ගමේ



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කර ඇති අංක ගා. 4011 හා 2013.03.11 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 සිට 06 වශයෙන් පෙන්නුම් කර ඇති, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0801ක් වූ පහත සඳහන් වන ඉඩම් කොටස් 03:

01. **කැබලි අක්ෂර 'ඒ' – වේබොක්කවත්ත.**
අංක ගා 4011 දරන මූලික පිඹුරේ කැබලි අංක 1, 2 හා 3.

02. **කැබලි අක්ෂර 'බී' – වේබොක්කවත්ත.**
අංක ගා 4011 දරන මූලික පිඹුරේ කැබලි අංක 5 හා 6.

03. **කැබලි අක්ෂර 'සී' – වේබොක්කවත්ත.**
අංක ගා 4011 දරන මූලික පිඹුරේ කැබලි අංක 4.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 ජූලි මස 01 වැනි දින අ. භා. 2.00 ට බෝපෙ - පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 ජුනි මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

පී. එස්. ගුණවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
බෝපෙ - පෝද්දල.

2013 මැයි මස 15 වැනි දින,
බෝපෙ - පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 – 216

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: උප/03/ඉඅත්/147.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 13/99/වීර්/259.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඳුකර පහළ කෝරළයේ මස්ගොල්ල ග්‍රාම නිලධාරී වසමේ මුල්ගම ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ. 5184 හා 2000.11.27 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 හා 02 ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 19.1160ක් පමණ වන මුල්ගම වත්ත මස්ගොල්ල වත්ත නමැති ඉඩම් කොටස් දෙක (02):

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: මුල්ගම වත්ත මස්ගොල්ල වත්ත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 18.3528.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: මුල්ගම වත්ත මස්ගොල්ල වත්ත; හිමිකම් කියන අය: ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණ හා ජනපද අධිකාරිය; ප්‍රමාණය: හෙක්. 0.7632.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 ජූලි මස 08 වැනි දින පූ. භා. 10.00 ට දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 ජූලි මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල් හා ඒ මුදල් ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

බී. එම්. පී. ජී. පී. වී. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
දොළුව.

2013 මැයි මස 06 වැනි දින,
දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 – 217

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: 3/2/3/10/247.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4/3/4/2011/D/06.

යුද්ධ හමුදාවේ මධ්‍යම අවි සහ පතරොම් ගබඩාවේ අවි/පතරොම් ගබඩා කිරීම සඳහා කඩවත පිහිටි රෙදිපිළි ගබඩාව ස්ථානගත කිරීමට අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 329බී, හිරිපිටිය (නැ.ගෙ.) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හිරිපිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට ගම්පහ කොට්ඨාස භාර මැනුම් අධිකාරී විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 510609 පිඹුරේ සඳහන් ඉඩම් කොටස පිළිබඳ විස්තර:

**කැබලි අංක 732**
ඉඩමේ නම: මීකාඩෝවත්ත, කොරකහලන්ද, දෙල්ගහවත්ත සහ නැදුන්ගහවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 33ක් බුදුගෙයක්, වතුර ටැංකි තුනක්, සිමෙන්තියෙන් බඳින ලද ළිං 02ක්, වැව් 02ක් සහ මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: මහජන බැංකු ප්‍රධාන කාර්යාලය, විශේෂ වත්කම් ඒකකය, කොළඹ 02; ප්‍රමාණය: හෙක්. 14.5686.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 ජූලි මස 24 වැනි දින පෙ.ව. 10.00ට අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 ජූලි මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂණ දිනයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඩී. එම්.රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
අත්තනගල්ල.

2013 මැයි මස 27 වැනි දින.
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 219

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.